## – අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2023

## සංයුක්ත ගණිතය

# ≈ සමතුලිතතාවය - 2 ≈

***Manoj Solangaarachchi***
***(B. Sc.)***

---

(01) දිග $2a$ හා බර $W$ බැගින් වන $AB, BC$ ඒකාකාර දඬු දෙකක් $B$ හිදී සුමටව සන්ධිකර $A\hat{B}C = 2\alpha$ වනසේ $A$ හා $C$ ලක්ෂ්‍ය සුමට තිරස් තලයක් මත තබා $ABC$ සිරස් තලයක සමතුලිතව තබා ඇත්තේ $A$ හා $C$ ලක්ෂ්‍ය යාකරන අවිතන්‍ය තන්තුවක් මගිනි. $B$ සන්ධියේ ක්‍රියාව, තන්තුවේ ආතතිය හා $A$ හා $C$ මත ප්‍රතික්‍රියා සොයන්න.

---

(02) සමාන දිග ඇති බර $W, 2W$ වන ඒකාකාර දඬු දෙකක් $B$ හිදී සුමටව සන්ධිකර $A$ හා $C$ කෙළවර සුමට තිරස් තලයක් මත වනසේද $ABC$ සිරස් තලයක වන සේද, $AB, BC$ දඬු තිරසට $\alpha$ ආනතව සමතුලිතව තබා ඇත්තේ $AB, BC$ හි මධ්‍ය ලක්ෂ්‍ය යාකරන අවිතන්‍ය තන්තුවකිනි. $B$ හි ක්‍රියාවේ සංරචක, $A$ හා $C$ හි ප්‍රතික්‍රියා, තන්තුවේ ආතතිය, සොයන්න. $B$ හි ක්‍රියාව තිරසට ආනත කෝණයේ tan අගය $\tan\alpha/6$ බව පෙන්වන්න. දණ්ඩක දිග $2a$ ලෙස ගනිමු.

---

(03) දිග $2a$ හා බර $W$ බැගින් වන ඒකාකාර $AB, BC$ දඬු දෙක $B$ හිදී සුමටව සන්ධිකර $A$ හා $C$ කෙළවර සුමට තිරස් තලය මත තබා $ABC$ සිරස් ව සමතුලිතව තබා ඇත්තේ $A$ හා $BC$ හි මධ්‍ය ලක්ෂ්‍ය යාකරන අවිතන්‍ය තන්තුවකිනි. $A\hat{B}C = 2\alpha$ වේ. $B$ හි ක්‍රියාව තන්තුවේ ආතතිය හා ස්පර්ශ ලක්ෂ්‍ය වල ප්‍රතික්‍රියා සොයන්න.

---

(04) දිග $2a$ හා බර $W$ බැගින් වන $AB, BC$ ඒකාකාර දඬු දෙක $B$ හිදි සුමටව සන්ධිකර $A$ අචල සුමට අසව්වකින් සවිකර $AB, BC$ දඬු තිරසට $\alpha, \beta$ ආනතව සමතුලිතතාවයේ තබා ඇත්තේ $C$ ලක්ෂ්‍යයේ දී යෙදූ තිරස් $2W$ බලයක් මගිනි. $\alpha, \beta$ හා $A, B$ සන්ධිවල ප්‍රතික්‍රියා සොයන්න.

---

(05) දිග $2a$ හා බර $W$ බැගින් වන ඒකාකාර දඬු හතරක් $A, B, C, D$ ලක්ෂ්‍ය වලදී සුමටව සන්ධිකර $A$ වලින් එල්ලා සමතුලිතව තබා ඇත්තේ $B$ හා $D$ ලක්ෂ්‍ය යාකරන සැහැල්ලු දණ්ඩක් මගිනි $B\hat{A}D = 2\alpha$ වේ. $C$ සන්ධියේ ක්‍රියාව සොයා සැහැල්ලු දණ්ඩේ ප්‍රත්‍යාබලයද සොයන්න.

(06) දිග $2a$ හා බර $W$ බැගින් වූ ඒකාකාර දඬු හතරක් $A, B, C, D$ ලක්‍ෂ්‍ය වලදී සුමටව සන්ධි කර $A$ වලින් එල්ලා සමචතුරස්‍රාකාර හැඩගන්වා, සමතුලිතව ඇත්තේ, $A$ හා $C$ ලක්‍ෂ්‍ය යාකරන අවිතන්‍ය තන්තුවකිනි. $B$ හෝ $D$ සන්ධියේ ක්‍රියාවද තන්තුවේ ආතතිය ද සොයන්න.

---

(07) දිග $2a$ හා බර $W$ බැගින් වන ඒකාකාර දඬු හතරක් $A, B, C, D$ ලක්‍ෂ්‍ය වලදී සුමටව සන්ධිකර $A$ වලින් එල්ලා $B\hat{A}D = 2\alpha$ වනසේ සමතුලිතව තබා ඇත්තේ $AB, BC$ හි මධ්‍ය ලක්‍ෂ්‍ය යාකරන අවිතන්‍ය තනතුවකින් වේ. නිදහස් සන්ධිවල ප්‍රතික්‍රියා හා තන්තුවේ ආතතිය සොයන්න.

---

(08) දිග $2a$ හා බර $W$ බැගින් වන ඒකාකාර දඬු හතරක් $A, B, C, D$ ලක්‍ෂ්‍යවලදී සුමටව සන්ධිකර $B\hat{A}D = 2\alpha$ වනසේ $A$ වලින් එල්ලා ඇත්තේ $BC, CD$ දඬු වල මධ්‍ය ලක්‍ෂ්‍ය යාකරන සැහැල්ලු දණ්ඩකිනි. නිදහස් සන්ධිවල ප්‍රතික්‍රියා හා සැහැල්ලු දණ්ඩේ ප්‍රත්‍යාබලය සොයන්න.

---

(09) දිග $2a$ හා බර $W$ බැගින් වන ඒකාකාර දඬු 6 ක් $A, B, C, D, E, F$ ලක්‍ෂ්‍යවලදී සුමටව සන්ධිකර, $A$ වලින් එල්ලා සමාකාර ෂඩාස්‍රයක ආකාරයෙන් සමතුලිතව තබා ඇත්තේ $BC, EF$ දඬුවල ලක්‍ෂ්‍ය දෙකකට සුමටව සන්ධිකර ඇති $PQ$ සැහැල්ලු තිරස් දණ්ඩක් මගිනි. නිදහස් සන්ධිවල ප්‍රතික්‍රියා හා සැහැල්ලු දණ්ඩේ ප්‍රත්‍යාබලය සොයන්න. $BP = x$ නම් $x$ සොයන්න.

---

(10) එක එකක දිග $2a$ ද බර $W$ ද වූ ඒකාකාර දඬු සුමට ලෙස සන්ධිකර තනාගත් $ABCDE$ පංචාස්‍රයක් සිරස් තලයක සමමිතිකව රඳවා ඇත්තේ $A$ ඉහළින්ම ද $CD$ තිරස්වද $AB$ ත් $AE$ ත් සුමට $P, Q$ නාදැති සමඟ ස්පර්ශ වෙමින්ද, පවතින පරිදිය. එකම තිරස් මට්ටමේ පිහිටි නැදැති අතර දුර කෙසේද යත් පංචාස්‍රය සවිධි ලෙස පවතින අයුරින් වෙයි. නැදැති මත ප්‍රතික්‍රියා සොයන්න.

(i) $B, C, D, E$ හිදී ප්‍රතික්‍රියා වල තිරස් සංරචක සමානද ඒ එක එකක විශාලත්ව $W\cot\frac{2\pi}{5}$ ද බවත්,

(ii) $A$ සන්ධියේ ප්‍රතික්‍රියාව $W\left(\frac{5}{2}\tan\frac{\pi}{5} - \tan\frac{\pi}{10}\right)$ ට සමාන තිරස් බලයක් බවත්,

(iii) $P$ හා $Q$ නාදැති අතර දුර $\frac{4a}{5}\cos\frac{\pi}{5}\left(6\cos^2\frac{\pi}{5} - 1\right)$ බවත් පෙන්වන්න.

**_Manoj Solangaarachchi_**
**_(B. Sc.)_**